# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 20 වැනි කාණ්ඩය | පෙබරවාරි 2022



- නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයට අදාළව කාරක සභා කිහිපයක නව සභාපතිවරුන් පත් කෙරේ.
- ව්‍යවස්ථාදායකයේ දැනුම, කොළඹ මහජන පුස්තකාලයේ නිලධාරීන්ට.
- බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික හා සමාජීය වෙනස්කම්

## "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහය දෙවැනි වෙළුම එළි දැක්වීම නියෝජ්‍ය කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන්

පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ දෙවැනි වෙළුම එළි දැක්වීම නියෝජ්‍ය කථානායක ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ මස 08 වැනි දා පාර්ලිමේන්තුවේදී සිදුවිය.

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# පාර්ලිමේන්තුව සැකෙවින්...

## පෙබරවාරි 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**පෙබරවාරි 04**

- **ශ්‍රී ලංකාවේ 74 වැනි නිදහස් දින පණිවිඩය** පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නිකුත් කිරීම.

**පෙබරවාරි 08**

- කම්කරු වන්දි (සංශෝධන) පනත් කෙටුම්පත පළමුවැනි වර කියවීම
- පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද "**පාර්ලිමේන්තු සාර සංහිතා**" ශාස්ත්‍රීය සංග්‍රහයේ දෙවැනි වෙළුම නියෝජ්‍ය කථානායක ගරු රංජිත් සියඹලාපිටිය මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී එළිදැක්වීම.
- **"ගෝලීයකරණ හා ප්‍රතිගෝලීයකරණ Anti-Globalization ප්‍රවණතා හමුවේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය"** යන ප්‍රධාන තේමාව යටතේ පාර්ලිමේන්තු සාර සංහිතා විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුම සඳහාද ශාස්ත්‍රීය ලිපි කැඳවීමේ නිල නිවේදනය ප්‍රකාශයට පත් කිරීම.

**පෙබරවාරි 10**

- **ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත්** කෙටුම්පත පළමුවැනි වර කියවීම.

**පෙබරවාරි 11**

- **අභාවප්‍රාප්ත ගරු මංගල සමරවීර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පිළිබඳ ශෝක යෝජනාව** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- **"පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය" අග්‍රාමාත්‍යවරයාට පිළිගැන්වීම.**

**පෙබරවාරි 14**

- **"මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන)" පනත් කෙටුම්පතට** කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.

**පෙබරවාරි 17**

- පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද "පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට" නමැති වැඩසටහනේ පළමු පියවර ලෙස **කොළඹ මහජන පුස්තකාලයේදී වැඩසටහනක්** මෙහෙයවීම.

**පෙබරවාරි 18**

- **"අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)", "පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීම", "අධිකරණ සංවිධාන (සංශෝධන)", "සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)" සහ "පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන)" පනත් කෙටුම්පත්වලට** කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.
- **"පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය" කථානායකවරයාට පිළිගැන්වීම.**

**පෙබරවාරි 22**


- **"අධිභාර බද්ද"** පනත් කෙටුම්පත පළමුවැනි වර කියවීම
- **"විශේෂ භාණ්ඩ හා සේවා බදු"** පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.

**පෙබරවාරි 23**

- **"බුද්ධිමය දේපළ (සංශෝධන)"** පනත් කෙටුම්පත පළමුවැනි වර කියවීම.
- "පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා" අවසන් වාර්තාවට අදාළ සාක්ෂි සහ සලකුණු කරන ලද වෙළුම් ඇතුළත් වාර්තාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පරිහරණය සඳහා පාර්ලිමේන්තු පුස්තකාලයේ තබා තිබෙන බවට කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.

**පෙබරවාරි 25**

- පහත සඳහන් **අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳව ශෝක යෝජනාව** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම:-
    - ගරු ආනන්ද රත්නායක මහතා
    - ගරු ආර්. ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ මහතා
    - ගරු සෝමවීර චන්ද්‍රසිරි මහතා
    - ගරු පී. බී. දිසානායක මහතා සහ
    - ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා










පුවත්

කාරක සභා පුවත්

පාර්ලිමේන්තුවෙන් ඔබට...

විශේෂාංග

කවරයේ කතාව

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# පටුන

## පුවත්

- "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහය දෙවැනි වෙළුම එළි දැක්වීම නියෝජ්‍ය කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන්
- පනත් කෙටුම්පත් සයකට කථානායකවරයාගේ සහතිකය
- පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා අවසන් වාර්තාවට අදාළ සාක්ෂි සහ සලකුණු සහිත වෙළුම් ඇතුළත් වාර්තාව කථානායකවරයාට
- "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහය අග්‍රාමාත්‍යවරයාට සහ කථානායකවරයාට පිළිගැන්වේ

## කාරක සභා පුවත්

- පළාත් පාලන මැතිවරණය කේවල සහ සමානුපාතික මිශ්‍ර ක්‍රමයකට පැවැත්වීමට අවධානය
- නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයට අදාළව කාරක සභා කිහිපයක නව සභාපතිවරුන් පත් කෙරේ.
- වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය
- අනතුරුවලදී ගෙවන උපරිම කම්කරු වන්දි මුදල රුපියල් ලක්ෂ 20 දක්වා ඉහළට නැංවීමේ කම්කරු වන්දි (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය

## පාර්ලිමේන්තුවෙන් ඔබට...

- "පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට" වැඩසටහනේ පළමු පියවර කොළඹ මහජන පුස්තකාලයේදී
- හන්දැස්ස අන්නූර් ප්‍රාථමික විදුහලේ සිසු සිසුවියන් සඳහා පාර්ලිමේන්තුවෙන් විශේෂ වැඩසටහනක්
- පාර්ලිමේන්තු ක්‍රමවේදය මහ බැංකු නිලධාරීන් වෙතට
- ව්‍යවස්ථාදායකයේ දැනුම, කොළඹ මහජන පුස්තකාලයේ නිලධාරීන්ට

## විශේෂාංග

- බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික හා සමාජීය වෙනස්කම්
- එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සහ ජනාධිපතිවරයා
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන ඔබ දැනුවත්ද?
- ගාලු පුරය හා බැඳි නායක නාමය විජයානන්ද දහනායක මැතිතුමා



# “පාර්ලිමේන්තු සාර සංහිතා” ශාස්ත්‍රීය සංග්‍රහය දෙවැනි වෙළුම එළි දැක්වීම නියෝජ්‍ය කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන්

***පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ දෙවැනි වෙළුම එළි දැක්වීම නියෝජ්‍ය කථානායක ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ මස 08 වැනි දා පාර්ලිමේන්තුවේදී සිදුවිය.***



මෙහිදී “පාර්ලිමේන්තු සාර සංහිතා” ශාස්ත්‍රීය කෘතියේ පළමු පිටපත පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා විසින් නියෝජ්‍ය කථානායක ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාට පිළිගන්වන ලදි. එසේම, පාර්ලිමේන්තුවේ සභානායක, අධ්‍යාපන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම යන මහත්වරුන්ටද මෙම අවස්ථාවේදී “පාර්ලිමේන්තු සාර සංහිතා” ශාස්ත්‍රීය කෘතිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පිළිගන්වන ලදී.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතාගේ මඟ පෙන්වීම යටතේ අංශ ගණනාවක් ඔස්සේ “පාර්ලිමේන්තු සාර සංහිතා” ශාස්ත්‍රීය සංග්‍රහයේ දෙවැනි වෙළුම සඳහා ලිපි ලබාගැනීම පසුගිය වසරේදී සිදු කරන ලදී.

ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, තිරසර සංවර්ධනය, මැතිවරණ ක්‍රමය සහ එහි සංශෝධන, පාර්ලිමේන්තු වාර්තාකරණය සහ ජනමාධ්‍ය, මහජන සබඳතාව හා ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ ප්‍රවණතා යන අංශ ගණනාවක් ඔස්සේ ශාස්ත්‍රීය ක්ෂේත්‍රය නියෝජනය කරන විද්වතුන් රැසකගේ ලිපි මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගතය. මෙහි සමාලෝචන මණ්ඩලය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල, කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අජන්තා හපුආරච්චි, කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්. ජී. යෝගරාජා, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ මහාචාර්ය ටියුඩර් වීරසිංහ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

එසේම “පාර්ලිමේන්තු සාර සංහිතා” විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුම සඳහා ද ශාස්ත්‍රීය ලිපි කැඳවීම නිල වශයෙන් ආරම්භ කරන බව අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන) එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් මෙම අවස්ථාවේදී ප්‍රකාශයට පත්කරන ලදි. මේ අනුව පසුගිය පෙබරවාරි 08 දින සිට අප්‍රේල් 24 දින දක්වා “ගෝලීයකරණ හා ප්‍රතිගෝලීයකරණ (Antiglobalization) ප්‍රවණතා හමුවේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය” යන ප්‍රධාන තේමාව මත පිහිටමින් අනුතේමා 11 ක් යටතේ තෙවැනි වෙළුම සඳහා ශාස්ත්‍රීය ලිපි කැඳවීම සිදුවනු ඇත.

මෙම අවස්ථාවට විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය නියෝජනය කරන විද්වතුන්, තවත් ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරන විද්වතුන් සහ පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.











**පුවත්**

# පනත් කෙටුම්පත් සයකට කථානායකවරයාගේ සහතිකය

**පසුගිය දා පාර්ලිමේන්තුවේදී විවාදයට ගෙන සම්මත වූ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) ඇතුළු පනත් කෙටුම්පත් සයකට කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සිය සහතිකය මෙම මස තුළ සටහන් කළේය.**



මේ අනුව අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන), පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම, අධිකරණ සංවිධාන (සංශෝධන), සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන), පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) යන පනත් කෙටුම්පත් පහටද කථානායකවරයා සිය සහතිකය සටහන් කළේය.

මෙම පනත් 2022 අංක 1 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන), 2022 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන), 2022 අංක 3 දරන පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීමේ, 2022 අංක 4 දරන අධිකරණ සංවිධාන (සංශෝධන), 2022 අංක 5 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) ලෙස මෙම මාසයේ සිට මෙරට නීති පද්ධතියට එක්විය.

# පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා අවසන් වාර්තාවට අදාළ සාක්ෂි සහ සලකුණු සහිත වෙළුම් ඇතුළත් වාර්තාව කථානායකවරයාට



2019 අප්‍රේල් 21 වැනි දා දිවයිනේ ස්ථාන කිහිපයක සිදු වූ පිපිරීම් ආශ්‍රිත සිදුවීම් මාලාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව හා සබැඳි අනෙකුත් සාක්ෂි සහ සලකුණු සහිත වෙළුම් ඇතුළත් වාර්තාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පරිහරණය සඳහා ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නීති කටයුතු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ හරිගුප්ත රෝහණධීර මහතා විසින් මේ මස 22 වැනි දා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත භාර දෙන ලදි.

ඒ අනුව, මෙම වාර්තාව නිල වශයෙන් කථානායකවරයාට භාරදීම කථානායක නිල කාමරයේදී සිදුවිය.

## පුවත්

# “පාර්ලිමේන්තු සාර සංහිතා” ශාස්ත්‍රීය සංග්‍රහය අග්‍රාමාත්‍යවරයාට සහ කථානායකවරයාට පිළිගැන්වේ




පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත “පාර්ලිමේන්තු සාර සංහිතා” ශාස්ත්‍රීය සංග්‍රහයේ දෙවැනි වෙළුම අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතා වෙත පිළිගැන්වීම සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත පිළිගැන්වීම පසුගිය දා පාර්ලිමේන්තුවේදී සිදුවිය.

පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා විසින් අග්‍රාමාත්‍යවරයාට හා කථානායකවරයාට කෘතිය පිළිගැන්වූ අතර පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනකාන්ත සිල්වා මහතා ද මේ සඳහා එක්විය.

ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, තිරසර සංවර්ධනය, මැතිවරණ ක්‍රමය සහ එහි සංශෝධන, පාර්ලිමේන්තු වාර්තාකරණය සහ ජනමාධ්‍ය, මහජන සබඳතාව හා ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනයේ ප්‍රවණතා යන අංශ ගණනාවක් ඔස්සේ ශාස්ත්‍රීය ක්ෂේත්‍රය නියෝජනය කරන විද්වතුන් රැසකගේ ලිපි මෙම ග්‍රන්ථය තුළ අන්තර්ගත වේ.














# කාරක සභා පුවත්










# පළාත් පාලන මැතිවරණය කේවල සහ සමානුපාතික මිශ්‍ර ක්‍රමයකට පැවැත්වීමට අවධානය

**කේවල සහ සමානුපාතික නියෝජන ක්‍රමයන් මිශ්‍ර වූ ක්‍රමයක් යටතේ පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී අවධානය යොමු විය.**

ඒ අනුව නියෝජිතයින් 60% ක් කේවල ක්‍රමය යටතේ ද 40%ක් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ද තෝරාගැනීම පිළිබඳව පැමිණි පාර්ශ්ව අතර සාකච්ඡා සිදු විය.

මේ පිළිබඳව සාකච්ඡා කරන ලද්දේ මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පාර්ලිමේන්තුවේ සභානායක, අධ්‍යාපන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 10 වැනි දා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

එසේම පළාත් පාලන මැතිවරණයේදී කාන්තා නියෝජනය වැඩි කිරීම අරමුණු කරගෙන සෑම දේශපාලන පක්ෂයක්ම නාම යෝජනා ලැයිස්තුවෙන් කාන්තාවන්ට වැඩි ඉඩක් ලබාදීම පිළිබඳව ද මෙහිදී අවධානයට ලක්විණි.













# නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයට අදාළව කාරක සභා කිහිපයක නව සභාපතිවරුන් පත් කෙරේ



## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (කෝපා) සභාපතිත්වය මහාචාර්ය තිස්ස විතාරණ මහතාට

නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු තිස්ස විතාරණ මහතා තේරී පත්විය. පාර්ලිමේන්තු සංකීර්ණයේදී මේ මස 10 වැනි දා රැස්වූ එම කාරක සභාවේදී රාජ්‍ය අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මහතා මේ සඳහා යෝජනාව ඉදිරිපත් කළ අතර, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අශෝක් අබේසිංහ මහතා එය ස්ථිර කළේය.

මහාචාර්ය තිස්ස විතාරණ මහතා නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේදී ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස කටයුතු කළේය.

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) සභාපතිත්වය මහාචාර්ය චරිත හේරත් මහතාට



නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු චරිත හේරත් මහතා තේරී පත්විය. පාර්ලිමේන්තු සංකීර්ණයේදී මේ මස 10 වැනි දා රැස්වූ එම කාරක සභාවේදී අමාත්‍ය ගරු සරත් වීරසේකර මහතා යෝජනාව ඉදිරිපත් කළ අතර, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා එය ස්ථිර කළේය.

මහාචාර්ය චරිත හේරත් මහතා නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේදී ද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස කටයුතු කළේය.



## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වය අනුර ප්‍රියදර්ශන යාපා මහතාට

නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයට අදාළව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා තේරී පත් විය. පාර්ලිමේන්තු සංකීර්ණයේදී මේ මස 08 වැනි දා රැස්වූ එම කාරක සභාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු රංජිත් බණ්ඩාර මහතා යෝජනාව ඉදිරිපත් කළ අතර, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් ප්‍රනාන්දු මහතා එය ස්ථිර කළේය.

අනුර ප්‍රියදර්ශන යාපා මහතා නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේදී ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස කටයුතු කළේය.

## මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වය ජගත් පුෂ්පකුමාර මහතාට



නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් පුෂ්පකුමාර මහතා තේරී පත් විය. පාර්ලිමේන්තු සංකීර්ණයේදී මේ මස 10 වැනි දා රැස්වූ එම කාරක සභාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර සුමිත්‍රආරච්චි මහතා යෝජනාව ඉදිරිපත් කළ අතර, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය එය ස්ථිර කළාය.

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයේ කටයුතු කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී ලොකුගේ මහතාය.

# වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය

■ යාල වනෝද්‍යානය දිවා කාලයේ දෙපැයක් වසා තැබීම, පැයක් දක්වා අඩුකිරීමේ තීරණයක්

■ දිවියන් පිළිබඳ දැනුවත් කිරීමේ විශේෂ මධ්‍යස්ථානයක් පොළොන්නරුවේ ඉදිකිරීමට පියවර

■ ජනතාවගේ පාරම්පරික ඉඩම් පවරා ගැනීමෙන් වළකින ලෙස අමාත්‍යවරයාගෙන් උපදෙස්



**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ එකඟත්වය මේ මස 22 වැනි දා හිමිවිය.**

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය ගරු සී.බී. රත්නායක සහ රාජ්‍ය අමාත්‍ය ගරු විමලවීර දිසානායක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී මෙම පනත් කෙටුම්පත සඳහා අනුමතිය හිමි වීම සිදු විය.

වඳ වී යෑමේ තර්ජනයට ලක්ව සිටින වන සත්ව වෘක්ෂලතා විශේෂ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) බලාත්මක කිරීම පිණිස නියෝග සෑදීමට අමාත්‍යවරයාට බලය හිමිවීම මෙම පනත් කෙටුම්පතට අනුව සිදුවේ. GSP සහනය ලබා ගැනීමේදීත් සැලකිල්ලට බඳුන් වන මෙම සංශෝධනය වසර 15 කට ආසන්න කාලයක් තිස්සේ සාකච්ඡා වූ බවත් ඒ අනුව අවසානයේ එය බලාත්මක කරන්නට හැකි වූ බවත් අමාත්‍යාංශ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතා මෙහිදී පැවසීය.

විදෙස් සංචාරක ආකර්ෂණය වැඩි කිරීම සඳහා පරිසර සංචාරක කර්මාන්තය (Eco tourism) දියුණු කිරීමේ අවශ්‍යතාවත්, විශේෂයෙන් වැඩි සංචාරක ආකර්ෂණයක් හිමිවන ශ්‍රී ලංකාවේ දිවියන් පිළිබද සංචාරක අමාත්‍යාංශය සමඟ එක්ව වඩාත් ආකර්ෂණීය වැඩසටහන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදීමට ඇති හැකියාව පිළිබඳවත් රැස්වීම සඳහා සහභාගී වූ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා පෙන්වා දුන්නේය.

මේ අනුව මේ පිළිබඳ අවශ්‍ය පියවර ගන්නා ලෙසත් පොළොන්නරුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානයේ දිවියන් පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානයක් පිහිටුවීමට පියවර ගන්නා ලෙසත් අමාත්‍ය ගරු සී. බී. රත්නායක මහතා නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දුන්නේය.

තවද වසර ගණනාවක් සේවය කොට තවමත් ස්ථිර පත්වීම් නොලැබූ ස්වෙච්ඡා සේවකයන් පිරිසක් ස්ථිර කිරීමේ අවශ්‍යතාව පිළිබඳවද මෙහිදී විපක්ෂ නායකවරයා අදහස් පළ කළේය. මේ පිළිබඳ කඩිනමින් සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස අමාත්‍යවරයා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

යාල ජාතික වනෝද්‍යානය දිවා කාලයේ පැය දෙකක් වසා තැබීම නිසා දෙස් විදෙස් සංචාරකයන්ට විශාල අපහසුතාවයකට මුහුණදීමට සිදුවන බව මන්ත්‍රීවරු මෙහිදී කියා සිටියහ. මේ පිළිබඳව අවධානය යොමුකළ රාජ්‍ය අමාත්‍ය ගරු විමලවීර දිසානායක මහතා, නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ දිවා කාලයේ වනෝද්‍යානය වසා තැබෙන මෙම කාල සීමාව පැයක් දක්වා අඩුකරන ලෙසයි. එසේම, වන සතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා උපරිම පියවර ගන්නා ලෙසද නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දුන්නේය.

එසේම, ඉඩම් පවරා ගැනීමේදී ජනතාව ජීවත්වන පාරම්පරික ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු නොකරන ලෙසද අමාත්‍ය ගරු සී. බී. රත්නායක මහතා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය. තවද අලි මිනිස් ගැටුම, අලි වැට ඉදිකිරීම, වනෝද්‍යානවල පවතින ගැටලු ආදී කරුණු රැසක්ද මන්ත්‍රීවරු අමාත්‍යවරයාගේ අවධානය පිණිස යොමු කළහ.



# අනතුරුවලදී ගෙවන උපරිම කම්කරු වන්දි මුදල රුපියල් ලක්ෂ 20 දක්වා ඉහළට නැංවීමේ කම්කරු වන්දි (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය



**සේවයේ යෙදී සිටියදී සිදුවන හදිසි අනතුරු හේතුවෙන් අගතියට පත්වන සේවකයන්ට ප්‍රතිලාභ වැඩි කිරීම සඳහා වන කම්කරු වන්දි (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ එකඟත්වය පසුගියදා හිමිවිණ.**

මෙම එකඟත්වය හිමි වූයේ කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා සහ රාජ්‍ය අමාත්‍ය ගරු පියංකර ජයරත්න යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

සේවයේ යෙදී සිටියදී සිදුවන හදිසි අනතුරු හේතුවෙන් අගතියට පත්වන සේවකයන්ට මරණයකදී හෝ පූර්ණ බෙලහීනතාවකදී  දැනට ගෙවන උපරිම වන්දි ප්‍රමාණය වන රු 550,000 ක මුදල,  රු 2,000,000 (විසි ලක්ෂය) දක්වා වැඩි කිරීම මෙමඟින් සිදුවේ.

එසේම දැනට රැකියා අවස්ථාවේදී පමණක් වන්දි ගෙවීමට ඇති විධි විධාන, රැකියා ස්ථානයට එන සහ යන අවස්ථා ඇතුළත් කොට අර්ථ නිරූපණය වඩාත් පුළුල් කිරීමද මේ හරහා සිදුවන බව නිලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ. තවද වන්දි ගෙවීම ප්‍රමාද වීමේදී  අයකරන අධිභාරයන් 10% සිට 30 % දක්වා වැඩි කිරීම ඇතුළු සංශෝධන කිහිපයක් මේ යටතේ සිදුවන බවත් ඔවුහු ප්‍රකාශ කළහ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා කිහිපයක් සලකා බැලීමද මෙහිදී සිදුවිය.

කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ මහතා ඇතුළු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල රාජ්‍ය නිලධාරීහු ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.





# “පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට” වැඩසටහනේ පළමු පියවර කොළඹ මහජන පුස්තකාලයේදී



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව නිවැරදි තොරතුරු මහජනයා වෙත සන්නිවේදනය කිරීමේ අරමුණින් සංවිධානය කරන “පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට” වැඩසටහනෙහි සමාරම්භය මෙම මස කොළඹ මහජන පුස්තකාලයේදී සිදුවිය.

පාර්ලිමේන්තුව පිළිබඳව රචිත ග්‍රන්ථ ඇතුළු ප්‍රකාශන කට්ටල දිවයිනම ආවරණය වන පරිදි මහජන පුස්තකාල හා පාසල් පුස්තකාල වෙත බෙදාහැරීම මෙම වැඩසටහනේ අරමුණයි. එසේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඓතිහාසික වටිනාකම, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ කාරක සභා ක්‍රමය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම ද මෙම වැඩසටහන මඟින් බලාපොරොත්තු වේ.

පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක මහතාගේ උපදේශකත්වයෙන් සහ පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) සහ වැඩබලන අධ්‍යක්ෂ (සන්නිවේදන) එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතාගේ මඟපෙන්වීම යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මකය.




මේ සඳහා සක්‍රීය පාර්ශ්වකරුවකු වීමට ඔබ/ඔබේ පුස්තකාලය සූදානමින් සිටින්නේ නම්, පහත දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, සන්නිවේදන දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකිය.

පාර්ලිමේන්තුවේ මහජන සේවා අංශය - 0112777138
එස්. ජේය ප්‍රකාශ් (මහජන සේවා සම්බන්ධීකාරක) - 0715352672





පාර්ලිමේන්තුවෙන් ඔබට...

# හන්දැස්ස අන්නූර් ප්‍රාථමික විදුහලේ සිසු සිසුවියන් සඳහා පාර්ලිමේන්තුවෙන් විශේෂ වැඩසටහනක්

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මහනුවර, හන්දැස්ස අන්නූර් ප්‍රාථමික විදුහලේ සිසු සිසුවියන් සඳහා පසුගියදා මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවැත්විණි.**

මෙහිදී, පාර්ලිමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) එම්. යූ. එම්. වාසික් මහතා පාර්ලිමේන්තුව පිළිබඳ හැඳින්වීම කළ අතර මහජන සේවා නිලධාරී යස්රි මොහමඩ් විසින් 'කුරුලු පාර්ලිමේන්තුව' පිළිබඳ කතාව ඉදිරිපත් කරන ලදී. පාර්ලිමේන්තුව හා සබැඳි විස්තර ඇතුළත් ඡායාරූප මහජන සේවා නිලධාරී පී. රුද්‍රකුමාර් විසින් ඉදිරිපත් කරන ලද අතර මාධ්‍ය නිලධාරී නුස්කි මුක්තාර් විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී.

මෙම වැඩසටහනට අන්නූර් ප්‍රාථමික පාසලේ විදුහල්පති ඒ. එම්. එම්. අනස් මහතා ඇතුළු ගුරුවරුන් සහ සිසු සිසුවියන් විශාල පිරිසක් එක්ව සිටියහ.
















# පාර්ලිමේන්තු ක්‍රමවේදය මහ බැංකු නිලධාරීන් වෙතට








පාර්ලිමේන්තු කටයුතු සහ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් මාලාවේ එක් පියවරක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් පිරිසක් සඳහා සංවිධානය කරන ලද විශේෂ වැඩසටහනක් පසුගියදා සාර්ථකව අවසන් විය. මෙම වැඩසටහන මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ට අත්‍යවශ්‍ය වන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (කෝපා) සම්බන්ධව දැනුවත් කිරීම සිදු කරන ලදී.


මෙහිදී කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ කාර්යභාරය පිළිබඳව ද සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා විසින් කාරක සභා ක්‍රමය පිළිබඳව සංක්ෂිප්ත හැඳින්වීමක් ද ඉදිරිපත් කළ අතර ව්‍යවස්ථාදායක සේවා සහ සන්නිවේදන අධ්‍යක්ෂ එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් ව්‍යවස්ථාදායකය සහ පනත් කෙටුම්පත්කරණය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳ නිවැරදි දැනුම සහ තොරතුරු ජනගත කිරීමේ අරමුණින් සන්නිවේදන දෙපාර්තමේන්තුව දියත් කෙරෙන මෙම වැඩසටහන් මාලාව මාර්ගගත ක්‍රමයට මෙන්ම බාහිර වැඩසටහනක් ලෙසද විවිධ රාජ්‍ය ආයතන සහ පාසල් සමඟ ඉදිරියට ද පැවැත්වීමට සැලසුම් කර තිබේ.















පාර්ලිමේන්තුවෙන් ඔබට...

# "ව්‍යවස්ථාදායකයේ දැනුම"

## කොළඹ මහජන පුස්තකාලයේ නිලධාරීන්ට









ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව නිවැරැදි තොරතුරු මහජනයා වෙත සමීපව සන්නිවේදනය කිරීමේ අරමුණින් පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද "පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට" වැඩසටහනෙහි සමාරම්භය පසුගියදා කොළඹ මහජන පුස්තකාලයේදී සිදුවිය.

පාර්ලිමේන්තුව පිළිබඳව රචිත ග්‍රන්ථ ඇතුළු ප්‍රකාශන කට්ටල දිවයිනම ආවරණය වන පරිදි මහජන හා පාසල් පුස්තකාල වෙත බෙදා හැරීම මෙම වැඩසටහනේ අරමුණයි.

මෙහි තවත් එක් ඉදිරි පියවරක් ලෙස පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කොළඹ මහජන පුස්තකාලයේදී සිදු කරන ලද්දේ පාර්ලිමේන්තුවේ ඉහළ නිලධාරීන්ගේ සහ පුස්තකාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙනි.


මෙහිදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඓතිහාසික වටිනාකම, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ කාර්යභාරය, කාරක සභා ක්‍රමය පිළිබඳ පුස්තකාලයේ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන ලද අතර පාර්ලිමේන්තුව මඟින් ප්‍රකාශිත "පාර්ලිමේන්තු සාර සංහිතා" ග්‍රන්ථය ඔවුන් වෙත පිළිගැන්වීමද මෙම අවස්ථාවේදී සිදු කෙරුණි.

මෙම වැඩසටහනට සමගාමීව පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමන් ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙකු වෙත කොළඹ මහජන පුස්තකාලයේ සාමාජික කාඩ්පත් තිළිණ කිරීමද සිදු වූ අතර පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත සාරසංහිතා ග්‍රන්ථය පුස්තකාලයාධිපතිනිය වෙත තිළිණ කිරීමද මෙහිදී සිදුවිණි.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා ඇතුළු ඉහළ නිලධාරීහු පිරිසකගේ දායකත්වය ලබාදීම විශේෂත්වයක් විය.





# බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික හා සමාජීය වෙනස්කම්

***1796 දී මෙරට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය පාලනයට යටත් වන විටත් පෘතුගීසි හා ලන්දේසි පාලනයන් යටතේ ශ්‍රී ලංකාව කිසියම් ආකාරයක බටහිරකරණයකට ලක් වී තිබුණි. 1815 උඩරට ප්‍රදේශ බ්‍රිතාන්‍ය පාලනයට යටත් වීමත් සමඟ මෙම ක්‍රියාදාමය කඩිනම් විය.***

පසුකාලීනව ලංකාවේ පාලනය සම්බන්ධයෙන් ඔවුන් මුහුණ පෑ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා 1833 දී විලියම් කෝල්බෲක්ගේ (William Colebrooke) ප්‍රධානත්වයෙන් කොමිසමක් පත් කර මෙරටට එවන ලදි. එහිදී අධිකරණ කටයුතු පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම පැවරුණේ බ්‍රිතාන්‍යය ජාතික නීතිවේදියෙකු වූ චාල්ස් හේ කැමරන් (Charles Hay Cameron) නමැති තැනැත්තාට යි. ඔවුන් විසින් ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ (Colebrooke-Cameron Reforms) ලෙස හඳුන්වනු ලබයි.

ශ්‍රී ලංකාවේ ලිබරල්වාදී ආර්ථික-දේශපාලන පරිවර්තනයේ මූලාරම්භය සිදුවන්නේ කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ සමඟයි. බ්‍රිතාන්‍ය ආණ්ඩුව මෙම ප්‍රතිසංස්කරණ මඟින් අපේක්ෂා කළේ මූලිකවම මෙරට පැවති අයහපත් මුල්‍යමය තත්ත්වයට විසඳුම් සෙවීමයි. එනම් ඒ වන විට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය විසින් ලංකාවේ පාලනය සඳහා වැය කළ මුදල් ප්‍රමාණයට සරිලන ආදායමක් නොලැබී තිබුණි. මේ නිසා ලාභ උපයන පරිදි සිය ප්‍රතිපත්ති සකස් කර ගැනීමට අධිරාජ්‍යවාදී පරිපාලනයට අවශ්‍ය විය.

## ආර්ථික වෙනස්කම්

බ්‍රිතාන්‍ය පාලන සමය තුළදී වරින් වර මෙරට ආර්ථික ලක්ෂණ වෙනස්වනු දක්නට ලැබුණි. සමකාලීනව බ්‍රිතාන්‍යය තුළ ක්‍රියාත්මක වුණු දේශපාලන හා ආර්ථික මතවාදවල බලපෑම නිසා ඔවුන්ගේ යටත්විජිත තුළ ද රාජ්‍ය නිර්බාධවාදී (Adam Smith's laissez-faire (French for "let it/them do")) අදහස් ව්‍යාප්ත විය. එමඟින් ආර්ථික කටයුතු කෙරෙහි වූ රාජ්‍යයේ මැදිහත්වීම අවම වී, පෞද්ගලික ආයෝජකයින් දිරිමත් කිරීම සිදු විය. එතෙක් රජයේ ඉඩම් විකිණීම සම්බන්ධයෙන් වූ නීතිරීති ලිහිල් වී වාණිජ වැවිලි කර්මාන්තය සඳහා උනන්දු වූවන්ට ඉඩම් මිලදී ගැනීමට මෙමඟින් අවස්ථාව සැලසුණි.

1796 දී බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණීමත් සමඟම ආරම්භ කර තිබූ මුතු කර්මාන්තයට හිමිව තිබූ ප්‍රමුඛස්ථානය එයින් විතැන් වී ක්‍රමයෙන් වාණිජ භෝග වගාවට යොමු විය. මුලින්ම වාණිජ භෝග වගාවන්ට යොමු වූවන් අතර යුරෝපීයයන් මෙන් ම ලාංකිකයෙක් ද වූහ. බ්‍රිතාන්‍ය පාලකයින් විසින් වාණිජ භෝග වගාවට අවශ්‍ය නීතිමය හා



පරිපාලනමය පසුබිම ක්‍රමයෙන් සකසා දීම ද විශේෂ ලක්ෂණයකි. 1848 දී කෝපි වගාවටත්, 1897 දී තේ හා රබර් වගාවන්ටත් සංවර්ධනය වීමට පහසුකම් සැලසීමට සම්මත කරන ලද මුඩුබිම් ආඥාපනත් (Waste Lands Ordinances) මෙහි දී කැපී පෙනේ. 1824 දී ජෝර්ජ් බර්ඩ් (George Bird) විසින් ගම්පහ ප්‍රදේශයේදී ආරම්භ කරන ලද ප්‍රථම කෝපි වගාවෙන් අනතුරුව මෙරට වාණිජ භෝග වගාවේ නැඟීම ඇරඹුණි. විශේෂයෙන්ම 1840 පමණ වන විට සිදු වුණු කෝපි වගාවේ නැඟීම, 1880 පමණ වන විට සිදු වුණු කොකෝවා හා රබර් වගාවන්හි නැඟීම හා තේ වගාවේ ආරම්භයත්, තේ වගාවට අවශ්‍ය ශ්‍රමිකයින් ඉන්දියාවෙන් ගෙන්වීමත් කැපී පෙනෙන සිදුවීම් ලෙස සැලකිය හැකිය.

මෙසේ වැවිලි කර්මාන්තයේ දියුණු වීමත් සමඟ ඒ හා බැඳුණු ප්‍රධානම සේවාවක් වන ප්‍රවාහන පද්ධතියක අවශ්‍යතාවය පැන නැගුණි. බ්‍රිතාන්‍යයන් මෙරට උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර සිට ම සිය චරපුරුෂ සේවාව හරහා සිදු කර තිබූ ප්‍රධානම ක්‍රියාවක් වන්නේ රට පුරා විහිදුණු හා කන්ද උඩරටට පිවිසිය හැකි සියලුම මාර්ග සොයා ගැනීමයි. මෙසේ සොයා ගත් මාර්ගයන් ක්‍රමයෙන් පුළුල් කර, ගමනාගමනයට සුදුසු පරිදි ගල් අතුරා සකස් කර ගැනීම නිසා ඔවුන්ට තමන්ගේ දුරබැහැර පිහිටි වතුයායන්හි සිට සිය නිෂ්පාදන ප්‍රධාන නැව් තොටුපොළවල් කරා ප්‍රවාහනය කිරීම පහසු විය. එසේම නව දුම්රිය මාර්ග ඉදි කිරීමට ද බ්‍රිතාන්‍යයෝ පියවර ගත්හ. මේ නිසා තවත් අතුරු කර්මාන්ත හා ව්‍යාපාර ගණනාවකට ද මඟ පෑදුණු අතර මෙරට සංවර්ධනය කඩිනම් වීමක්ද මෙමඟින් සිදුවිණි.

## සමාජීය වෙනස්කම්

කෝල්බෲක් හා කැමරන් ප්‍රතිසංස්කරණ මඟින් මෙරට ලිබරල්වාදී ආණ්ඩුක්‍රම රටාවකට මුල පිරුව ද කොමසාරිස්වරු එයින් අදහස් කරන ලද්දේ ලාංකික ජනතාවට ලිබරල් ස්වරූපයක් ලබා දීම නොව, බ්‍රිතාන්‍යය ව්‍යවසායක පන්තියට අවශ්‍ය වූ නිදහස් පසුබිම මෙරට තුළ ඇති කිරීමයි.

මෙම ප්‍රතිසංස්කරණත් සමඟ රාජාණ්ඩු ක්‍රමය හා බැඳී තිබුණු වැඩවසම්වාදී සමාජ ක්‍රමය ද ක්‍රමයෙන් ලිහිල් වන්නට විය. බොහෝ ඉඩම් වල හිමිකම රාජ්‍ය පාලනයෙන් ගිලිහී පෞද්ගලික ව්‍යවසායකයින් සතුවන විට නින්දගම් භුක්ති විඳීමේ ක්‍රමය අහෝසි වී යාම ආරම්භ වූ අතර මෙය බොහෝ ලාංකිකයින්ගේ අප්‍රසාදයට හේතු විය. වැවිලි කර්මාන්තයට අවශ්‍ය වූ විශාල ශ්‍රමික පිරිසේ අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි වීමට මෙය ද එක් පසුබිම් කාරණයක් විය. එලෙස ලාංකික ජනතාව ශ්‍රමිකයින් ලෙස කටයුතු කිරීමට මැලිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දීය කම්කරුවන් මෙරටට ගෙන්වීමට සිදු විය.

ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් සංවර්ධනය වන විට ජනගහනය ද වර්ධනය වන්නට විය. එයින් රජයේ කාර්යභාරය ද පුළුල් විය. මේ නිසා නීතිගරුක පුරවැසි පාලනයක් උදෙසා 1907 දී බ්ලේක් ආණ්ඩුකාරවරයා විසින් කාර්යක්ෂම පොලිස් සේවාවක් ද ආරම්භ කෙරුණි.

19 වන සියවසේ අවසාන භාගය වන විට ස්වදේශීය ධනපති පන්තිය නිර්මාණය වෙමින් තිබුණි. අරක්කු රේන්දය මඟින් ද, බ්‍රිතාන්‍ය පාලකයින්ට ගෘහ භාණ්ඩ සැපයීමෙන් ද, ගෘහ නිර්මාණකරණයේ නිරත වීමෙන් ද, භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල නියුක්තවීමෙන් ද මුදල් එක්රැස් කර ගත් පිරිස් ප්‍රාග්ධන සම්පාදනයේ පෙරමුණ ගත් ස්වදේශිකයෝ වූහ. බ්‍රිතාන්‍යයන් විසින් රාජකාරි ක්‍රමය අහෝසි කළ හෙයින් එතෙක් තමන්ට නියම වුණු එක් රැකියාවක පමණක් සිර වී සිටි ජනතාව නිදහසේ ශ්‍රම සංචලනයකට යොමු විය.

ප්‍රාග්ධන සම්පාදනයේ අනෙක් පදනම වූයේ බටහිර අධ්‍යාපන ක්‍රමයෙන් උසස් ඵල ලැබූ පිරිස් ය. 1874 දී මෙරට නීති විද්‍යාලය ද, 1870 දී වෛද්‍ය විද්‍යාලය ද බිහි විය. මෙම වර්ධනයන් හි අරමුණ වූයේ බ්‍රිතාන්‍ය පරිපාලනයට අවශ්‍ය වූ සුදුසුකම් ලත් නීතිඥයින් හා වෛද්‍යවරුන් පුහුණු කරවා ගැනීමයි. කෙසේ වුව ද නීතිඥයින් හා වෛද්‍යවරුන් බිහි වූයේ ධනපති පන්තියෙන් පමණක් වූ අතර එම පවුල්වල දරුවෝ මෙරට උසස් විද්‍යාලවල අධ්‍යාපනය ලබා බ්‍රිතාන්‍යයට ද ගොස් එහි දී ද නීති හා වෛද්‍ය ක්ෂේත්‍රයන් හි අධ්‍යාපනය ලබා මෙරට වෘත්තිකයින් ලෙස කටයුතු කරමින් ධනය ඉපයූහ. පසුකාලීනව මෙරට වතු වගාවේ ප්‍රමුඛයන් වන්නේ ද, ධනේශ්වර පන්තියේ දේශපාලඥයින් වන්නේ ද මෙම වෘත්තීය ධනවතුන් ය.

එසේම "ලංකා ජාතික සංගමය" වැනි ලාංකික ජාතික ව්‍යාපාර ආරම්භ කර නිදහස් අරගල සංවිධානය කිරීමට හා ජාතිකාභිමානී අදහස් ප්‍රචලිත කිරීමට පෙරමුණ ගැනීම, බ්‍රිතාන්‍ය පාලනය යටතේ යටත්විජිතයක් වූ ලංකාවේ බිහි වුණු නව ධනපති හා මධ්‍යම පන්ති සාමාජිකයෝ පුරෝගාමීව කටයුතු කළහ. ලංකා ජාතික සංගමය යල් පිනූ ක්‍රියාමාර්ගයන් ගන්නා විට වාමාංශික ව්‍යාපාරය බිහි කිරීමට පවා ඔවුහු පුරෝගාමීව ක්‍රියා කළ බව පෙනී යයි.

**රංජනා රණසිංහ**
**පාර්ලිමේන්තු නිලධාරි**
**පනත් කෙටුම්පත් කාර්යාංශය**

විශේෂාංග

# එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සහ ජනාධිපතිවරයා




**ලෝක දේශපාලනය තුළ විධායක ජනාධිපති ක්‍රමයේ පූර්වාදර්ශී රාජ්‍යයක් ලෙස ඇමෙරිකාවට ප්‍රධාන ස්ථානයක් හිමිවෙයි. ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩු ක්‍රමයකි. සිව් වසරක නිල කාලයක් සඳහා ඇමරිකානු ජනාධිපතිවරයා පත් වන අතර ඔහු තෝරාගනු ලබන්නේ ඡන්ද විද්‍යාල ක්‍රමයක් හරහාය.**

ඇමරිකාව ප්‍රාන්ත 50කින් සමන්විත සංඝීය රාජ්‍යයක් වේ. ජනාධිපතිවරයා පත් කර ගැනීමේදී ඒ ඒ ප්‍රාන්තයට හිමි ඡන්ද විද්‍යාල සංඛ්‍යාව අනුව ඒ ඒ ප්‍රාන්තයට ජනාධිපතිවරයා පත් කිරීම සම්බන්ධයෙන් වැඩි බලපෑමක් කිරීමට හැකියාව ලැබී ඇත. මෙහිදී වැඩිම ඡන්ද විද්‍යාල සංඛ්‍යාවක ජය තහවුරු කර ගන්නා අපේක්ෂකයාට එරට ජනාධිපතිවරයා ලෙස පත්වීමට හැකියාව ලැබේ. නමුත් එක්සත් ජනපද ව්‍යවස්ථාවට අනුව එක් පුද්ගලයෙකුට ජනාධිපති ලෙස පත්විය හැකි වන්නේ දෙවතාවක් පමණි.

ඇමෙරිකානු පක්ෂ ක්‍රමය ද්වී පක්ෂ ක්‍රමයක් ලෙස විචාරකයින් හඳුන්වයි. ඊට හේතුව ලෙස විචාරකයින් දක්වන්නේ එරට රාජ්‍ය බලය දිනාගැනීමට තරම් ශක්තිමත් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් පමණක් ක්‍රියාත්මක වීමයි. මෙම ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන්නේ රිපබ්ලිකන් පක්ෂය සහ ඩිමොක්‍රටික් පක්ෂයයි. මේ අනුව මෙම පක්ෂ දෙකෙන් එකකින් එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා පත් වේ. මෙම පක්ෂ දෙකෙන් එරට ජනාධිපතිවරයා පත් වුවද ඉන් අදහස් වන්නේ එරට ඇත්තේ දේශපාලන පක්ෂ දෙකක් පමණක් වන බව නොවේ. කොමියුනිස්ට් පක්ෂය, සමාජවාදී පක්ෂය, හරිත පක්ෂය, ඇමරිකානු කම්කරු පක්ෂය වැනි තවත් දේශපාලන පක්ෂ එරට ක්‍රියාත්මක වේ. නමුත් එම පක්ෂ රාජ්‍ය බලය දිනාගැනීමට තරම් ශක්තිමත් පක්ෂ නොවේ.

එසේම ලෝකයටම බලපෑම් කළ හැකි දේශපාලන නායකයන් අතර ඇමෙරිකානු ජනාධිපතිවරයා ඉහළින්ම සිටී.

ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය අනුව පිහිටා ඇති ව්‍යවස්ථාදායක ආයතනය කොංග්‍රස් මණ්ඩලයයි. එය

01. නියෝජිත මන්ත්‍රීමණ්ඩලය
02. සෙනෙට් සභාව

ලෙස මණ්ඩල දෙකකින් සමන්විත වේ. කොංග්‍රස් මණ්ඩලයේ පළමු මණ්ඩලය වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 435 ක් පමණ වේ. ඇමෙරිකානු කොංග්‍රස් මණ්ඩලයේ දෙවන සභාව සෙනෙට් සභාව වන අතර එහි සමාජික සංඛ්‍යාව 100 කි. එරට ප්‍රාන්ත 50 නියෝජනය කරමින් මෙම සාමාජිකයින් සෙනෙට් සභාවට තෝරා ගනියි. මේ ආකාරයට එරට සෙනෙට් සභාව එරට ප්‍රාන්ත ආණ්ඩුවලට මධ්‍යම ආණ්ඩුව තුළ සමාන නියෝජනයක් ලබාදීමට උත්සාහ කොට ඇත. විධායක ජනාධිපතිවරයා සිදු කරන රාජ්‍ය පත්කිරීම් වලට සෙනෙට් සභාවේ අනුමතිය හිමි විය යුතුය. එසේම ජනාධිපතිවරයා එළඹෙන විදේශ ගිවිසුම් සෙනෙට් සභාවේ විශේෂ බහුතරයකින් අනුමත කළ යුතුය. නීති සම්පාදනය සම්බන්ධයෙන්ද සෙනෙට් සභාවට බලතල හිමි වේ.

මේ ආකාරයට එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සහ විධායක ජනාධිපතිවරයා පිළිබඳ හඳුනාගත හැකිය.

**ආසිරි හපුගොඩ**
**මාධ්‍ය නිලධාරී**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන ඔබ දැනුවත්ද?




**“තොරතුරු වල අයිතිය රජය සතුය”** යන සංකල්පයේ සිට **“තොරතුරුවල අයිතිය ජනතාව සතුය”** යන නව පරිපාලන සංස්කෘතිය හරහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ලෝකය පුරා මිනිස් අයිතිවාසිකමක් ලෙස පිළිගනු ලබයි. තොරතුරු දැනගැනීමේ නිදහස මානව අයිතිවාසිකමක් පමණක් නොව, පුරවැසියාට පවත්නා රජයන්ගෙන් වගවීම ඉල්ලා සිටීමට සහ දූෂණයට එරෙහිව සටන් කිරීමට, මෙන්ම පුරවැසියන් සම්බන්ධ කර ගැනීමට සහ බල ගැන්වීමට අත්‍යවශ්‍ය මෙවලමක් ද වේ.

ස්වකීය ජීවිතවලට බලපාන්නාවූ රජයේ ප්‍රතිපත්ති සහ තීරණ පිළිබඳ දැනගැනීමට පුරවැසියන්ට ඇති අයිතිය, තොරතුරු දැනගැනීමේ අයිතියේ මූලික හරය ලෙස සැලකේ. මහජන මුදල් යම් යම් කටයුතු සඳහා වෙන්කිරීම සහ වියදම් කිරීම සිදු කරන්නේ කෙසේද යන්න පුරවැසියන්ට දැන ගැනීමේ අයිතිය මේ තුළ ඇතුළත්ව තිබේ. මහජන සේවාවන් සැපයීමේ ක්‍රියාවලිය සම්බන්ධ සියලු තොරතුරු පහසුවෙන් මහජනතාවට ලබා ගත හැකි වන පරිදි විවෘත රාජ්‍ය පාලනය ආයතනගත කිරීමෙහි මූලික සංකල්පය වන්නේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතයි.

සාධාරණ හා යුක්තිසහගත ජන සමාජයක තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කරලීම අත්‍යවශ්‍ය වන කරුණු ලෙස :-

- ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය ඵලදායීව ක්‍රියාවට නැංවීමට හැකි වීම;
- රාජ්‍ය තන්ත්‍රයෙහි විනිවිද බව, දූෂණයෙන් තොර බව හා වගවීම සාක්ෂාත් කළ හැකි වීම;
- පුරවැසියන් විසින් රජයේ කටයුතු විමර්ශනය කොට ඒවා අභියෝගයට ලක් කළ හැකි වීම;
- අසාධාරණය, අයුක්ති සහගත වීම, සම්පත් නාස්තිය හා අවභාවිතාව සහ නීතියට පටහැනි භාවිතාව පිළිබඳ ජනතාවට ප්‍රශ්න කළ හැකි වීම;

යනාදිය දැක්විය හැකිය.

තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක 10 හා 16 මගින් නීති හා ප්‍රතිපත්ති රාමුවක අවශ්‍යතාව පෙන්වා දී ඇති අතර තොරතුරු දැනගැනීමේ අයිතිය, පනතක් මගින් සිය පුරවැසියන් වෙත ලබාදුන් පළමු රට වනුයේ ස්වීඩනයයි. මේ වන විට රටවල් 121 ක් තුළ හා ලෝක ජනගහනයෙන් 90% ක් අතර තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කර තිබේ.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සංශෝධිත 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව මඟින් සෑම පුරවැසියෙකුටම තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇත. 2016 අගෝස්තු 4 වැනි දින සිට නීතිගත වී ඇති, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනිකුත් පනත්වලට සාපේක්ෂව විශේෂ වනුයේ, වෙනත් අණපනත් ක්‍රියාත්මක කරනු ලබන්නේ නිලධාරීන් විසින් වුවද මෙම පනත ක්‍රියාත්මක කරනු ලබන්නේ පුරවැසියා විසින්ම වීමයි.

අද වන විට තොරතුරු දැනගැනීමේ අයිතිය, මිනිසුන්ගේ ජන ජීවිතය වෙනස් කළ හැකි මෙවලමක් බවට පත්ව ඇත. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රවර්ධනය කිරීම සහ දූෂණයට එරෙහිව සටන් කිරීමේ අවියක් ලෙස ක්‍රියා කරමින් මෙම පනත ආරක්ෂා කිරීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය, මහජන නියෝජිතයන්, දේශපාලනඥයන් සහ සාමාන්‍ය පුරවැසියන්ට ප්‍රධාන කාර්යභාරයක් පැවරී ඇත.

**ප්‍රාර්ථනා කුලතුංග**
**සහකාර ප්‍රධාන නිලධාරී,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකය**

විශේෂාංග



# ගාලු පුරය හා බැඳි නායක නාමය

# විජයානන්ද දහනායක මැතිතුමා

**ගාලු පුර අභිමානවත් ජනනායකයකු වූ ආචාර්ය විජයානන්ද දහනායක මැතිතුමා එකල එනම් මීට දශක හතරකට පමණ පෙර දකුණේ ජීවත් වූ ජනතාවට නිතර මුණ ගැසුන ජනතාව අතර ගැවසුනු ජන නායකයයෙකි. එතුමා පොදු ජනතාව ගමන් කරන බස් රථයෙන් දුම්රියෙන් ගමන් කරන අවස්ථා එකල බහුලව දැකිය හැකි විය.**

1959 වර්ෂයේ සැප්තැම්බර් 26 සිට 1960 වර්ෂයේ මාර්තු 20 දක්වා අප රටේ අග්‍රාමාත්‍යවරයා ලෙස සේවය කළ ආචාර්ය ඩබ්ලිව්. දහනායක මැතිතුමා සැලකෙන්නේ මෙරට පස්වන අග්‍රාමාත්‍යවරයා ලෙසයි. එම තනතුරට අමතරව අධ්‍යාපන, කෘෂිකර්ම හා ඉඩම්, ස්වදේශ සහ සමුපකාර යන අමාත්‍ය ධුර රැසක් හොබවා ඇති එතුමාගේ දේශපාලන ගමන් මග අරඹා තිබුණේ 1935 වසරේ ගාල්ල නගර සභා නියෝජිතයකු වශයෙනි. පසුව එම නගර සභාවේ නගරාධිපතිවරයා ලෙසද එතුමා කටයුතු කොට ඇත. දහනායක මැතිතුමාගේ දේශපාලන ගමන් මග එක්සත් ජාතික පක්ෂය, නව ලංකා සමසමාජ පක්ෂය, මහජන එක්සත් පෙරමුණ වැනි දේශපාලන පක්ෂ රැසක් හා බැඳී පැවති අතර එතුමා සිය දේශපාලන ගමන අරඹා තිබුණේ සිය වෘත්තිය වූ ගුරු වෘත්තියට සමු දී බව සඳහන් වේ.

විජයානන්ද දහනායක මැතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස බොහෝ ඵලදායී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලද අතර විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීම, ගුරු විද්‍යාල පුහුණු කාලය තුළ පුහුණුවන ගුරුවරු වෙනුවෙන්ද වැටුපක් ගෙවීම ඉන් ප්‍රධාන ඒවා විය. අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස එදා ළමා පරපුර වෙත දිවා ආහාරයක් ලෙස බනිස් ගෙඩියක් සහ කිරි වීදුරුවක් ලබා දීම නිසා එතුමාට "බනිස් මාමා" ලෙස නමක් පටබැඳුණේද එම කාල වකවානුව තුළයි.

පාර්ලිමේන්තු ඉතිහාසයේ දීර්ඝතම කථාව සඳහා හිමිකම් කියන්නේද විජයානන්ද දහනායක මැතිතුමා ය. එනම් 1945 අගෝස්තු 23 වන දින බිබිලේ ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් ආරම්භ කළ එම කථාව සඳහා පැය 13 ක් පමණ ගත කර ඇති බව හැන්සාඩ් වාර්තාවන්ගෙන් තහවුරු වේ. එසේම එතුමා විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීම පිණිස වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් 1958 සැප්තැම්බර් 16 වැනි දින කළ කථාව ඇතුළත් හැන්සාඩ් වාර්තාවෙන් උපුටාගත් පහත සඳහන් කොටස එතුමා කෙතරම් ජනතා සේවයට කැප වූ නායකයෙක් ද යන්න තහවුරු කරන කදිම නිදසුනකි.

**" අද අපට ඇත්තේ එකම විශ්වවිද්‍යාලයයි. නමුත් ජනගහනයේ ප්‍රමාණයත් පාඨශාලාවලට පැමිණෙන ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව සහ උසස් අධ්‍යාපනයට සුදුසු ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාවත් අනුව බලන විට, අද මේ මොහොතේදී විශ්වවිද්‍යාල 4 ක්, අඩු වශයෙන් 3 ක් වත් මේ රටේ තිබීම අවශ්‍යයි. කල්යල් නොගොස් මේ මොහොතේම එසේ කිරීමට ඉඩ තිබෙනවා. එම නිසා, මේ රජයට තිබෙන තවත් කාර්යයක් තමයි, අලුත් විශ්වවිද්‍යාල පිහිටුවීම. ඒ විශ්වවිද්‍යාල පිහිටුවන පිළිවෙළ සම්බන්ධයෙන් තර්කයක් තිබුණා.එක විශ්වවිද්‍යාලයක් අපේ රටට මදිය කියන තර්කය සෑම කෙනකු විසින් ම පිළිගන්නා තර්කයක්. මේ විදියට කල්පනා කර බලන විට කථානායකතුමනි, අපේ සාමාන්‍ය මනුෂ්‍යයින් කථාකරන භාෂාවෙන් කියනවා නම්, දේව පිහිටක් අනුව වාගේ, වැඩි මහන්සියක් නැතුව ඒ සඳහා ආයතන පිළියෙල වී තිබෙනවා. පිටරට වලින් කුමන විධියේ කරදර හිරිහැර පැමිණුනත්, මෙපමණ කාලයක් තිස්සේ මුළුගැන් වී සැඟවී නටඹුන් නොවී රට, ජාතිය, භාෂාව ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වීම සඳහා අපේ පිරිවෙන් පුල පුලා සිටියා. මෙය මා කල්පනා කරන්නේ අපේ රටේ පාර්ලිමේන්තුවට ලැබුණු දේව වරප්‍රසාදයක් කියායි. පිරිවෙන් වලට විශ්වවිද්‍යාල තත්ත්වය දෙනු ලබන්නේ පාර්ලිමේන්තුවෙන් බව ඇත්ත. නමුත් එය පාර්ලිමේන්තුවෙන් දුන්නත් අපේ ලංකාව ආරක්ෂා කරන දෙවිවරුන්ගෙන් අප රටට ලැබුණු වරප්‍රසාදයක් හැටියට මතක් කරමින්, මේ මහජන රජයේ අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඉතාම සන්තෝෂයෙන් මම මෙම පනත ඉදිරිපත් කරනවා "**






එතුමා මූලික අධ්‍යාපනය ලද පාසල වන රිච්මන්ඩ් විද්‍යාලය පිහිටි රිච්මන්ඩ් කන්ද පාමුලින් දිවෙන ප්‍රධාන මාර්ගයේ ගමන් කරන ඕනෑම අයෙකුට ආචාර්ය විජයානන්ද දහනායක මැතිතුමාගේ නිවස අද වුවද දැකිය හැකිය. එතුමා ජීවත්ව සිටි සමයේ බොහෝ පිරිස් එතුමා හමු වීමට එහි රැඳී සිටිනු දක්නට ලැබුණු අතර ඕනෑම වේලාවක එතුමා හමු විය හැකි විය. එසේම එකල දුරකථන ඇමතුමක් ලබා දීම පහසු කටයුත්තක් නොවූ බැවින් ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් එතුමා තම දුරකථනය භාවිත කිරීමට ඉඩ දී තිබුණු අතර ඒ සඳහා කුඩා කාමරයක් එතුමාගේ කාර්යාලයට යාබදව වෙන්කර දී තිබුණි.

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ අගනගරය වන ගාල්ල නගරය යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම නගරයක් ලෙස නම් කර තිබේ. එයට හේතුව ගාල්ල නගරයේ ඇති පෞරාණික වටිනාකමයි. එම වටිනාකම රැක ගනිමින් ගාලු පුරවරයේ පවතින පරිසර සෞන්දර්යය හා අභිමානය ආරක්ෂා කිරීමට මෙම රාජ්‍ය නායකයා බොහෝ උත්සාහ ගෙන තිබුණි.

රට, දැය, සමය වෙනුවෙන් අමිල සේවයක් කළ ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක මැතිතුමා, 1997 මැයි 04 වැනි දින දිවියෙන් සමුගන්නා විට, එතුමාට වයස අවුරුදු 95 ක් විය. මෙම රාජ්‍ය නායකයාට ගෞරව දැක්වීමක් වශයෙන් එතුමාගේ සම්පූර්ණ රුව දැක්වෙන ආලේඛ්‍ය චිත්‍රයක් පාර්ලිමේන්තුවේ ජනාධිපතිතුමාගේ කාර්යාලය අසල ආලින්දයේ ඇති රාජ්‍ය නායකයින්ගේ ඡායාරූප අතරට එක් කොට තිබේ.

**ඊ. ඩී. ජේ. වික්‍රමසිංහ**
**ප්‍රධාන නිලධාරී**
**මන්ත්‍රී සේවා කාර්යාංශය - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

# කවරයේ කතාව

යහ බලාපොරොත්තු සහ ප්‍රාර්ථනාවන්ගෙන් පිරුණු, ඈත නිල්ලෙන් හෙබුණු සාරවත් අනාගතය දෙස බලා සිටිය හැකිවන පරිද්දෙන් නිර්මිත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහි මූලාසනය දැක්වෙන විරල ගණයේ ඡායාරූපයක් මෙවර පුවත් හසුනෙහි කවරයේ කතාවට විෂය වෙයි. මෙහි මුලසුන අසුන් ගන්නේ මෙරට තෙවැනි පුරවැසියා ලෙස සැලකෙන කථානායකවරයා හෝ ඔහු නියෝජනය කරන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පමණි. එසේ අසුන් ගන්නා අයෙකුගේ නෙත් මානය ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සංකීර්ණයෙහි එක් අන්තයක් තෙක් දර්ශනය වන පරිදි මෙහි මුල්ම සැලැස්ම



කීර්තිධර ගෘහ නිර්මාණ ශිල්පී ජෙෆ්රි බාවා විසින් නිමවා ඇත්තේය. කථානායක අසුනට පහතින් පාර්ලිමේන්තුවේ අධිකාර බලය සංකේතවත් කරන සෙංකෝලය රඳවනය තබා ඇති අතර ඊට ඔබ්බෙන් ඇති අසුන පාර්ලිමේන්තු කටයුතු ව්‍යවස්ථානුකූලව සහ සම්ප්‍රදායානුකූලව පවත්වාගෙන යනු පිණිස කථානායකවරයාට සහාය වන පාර්ලිමේන්තු ලේකම් මණ්ඩලය වෙත පැනවෙයි.

මෘදු ආලෝකයකින් යුතු මෙකී පාර්ලිමේන්තු සභාගර්භයට ප්‍රවිෂ්ට වන ලෝහිත වර්ණැති ඉන්දියානු පලසකින් සැරසූ පියගැට පෙළ ද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිත්‍ය ඡායාරූප ශිල්පී නුවන් දුමින්දගේ මෙම ඡායාරූවට මනාව හසුව තිබෙයි. සභාගර්භය අභ්‍යන්තරයට විවර වන විසල් ද්වාරය දුලබ, පුරාණ ලාංකික වියන් සැරසිල්ලක අනුරූ ගත් සුවිසෙස් කැටයමකින් යුක්තය. ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ පූර්විකාව කැටයම් කර ඇත්තේද මෙම ද්වාරය මධ්‍යයෙහිය.

# පාර්ලිමේන්තු සාර සංහිතා: විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය
# තෙවැනි වෙළුම සඳහා
# ලිපි කැඳවීම




**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කෙරෙන**
**පාර්ලිමේන්තු සාර සංහිතා: විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය**
**තෙවන වෙළුම සඳහා ලිපි භාරගනු ලැබේ.**

## ගෝලීයකරණ හා ප්‍රතිගෝලීයකරණ (Antiglobalization) ප්‍රවණතා හමුවේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය

යන ප්‍රධාන තේමාව මත පිහිටමින් පහත සඳහන් අනුතේමා යටතේ ලිපි සම්පාදනය කළ හැකිය

- සමාජ මාධ්‍ය, ප්‍රජා සහභාගීත්වය හා පාර්ලිමේන්තුව පිළිබඳ ප්‍රජා සංජානනය
- ගෝලීයකරණය හා අන්තර්ජාතික සම්බන්ධතා
- පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය හා ප්‍රජාතන්ත්‍රවාදය
- තොරතුරු සමාජය, සන්නිවේදනය, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය
- නව සාමාන්‍යකරණ තත්ත්ව යටතේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය
- දේශපාලනයේ ස්ත්‍රීහු  හා තරුණයෝ
- දේශපාලන සංස්කෘතිය, සමාජානුයෝජනය, ප්‍රජාතන්ත්‍රවාදය හා අධ්‍යාපනය
- පාර්ලිමේන්තු සන්නිවේදනය හා ජාතික භාෂා ප්‍රතිපත්තිය
- ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය හා මාධ්‍ය බලපෑම
- අතථ්‍ය මහජන අවකාශය හා ප්‍රජාතන්ත්‍රවාදය යළි සලකා බැලීම
- ආබාධ සහිත තැනැත්තන්ගේ යහ පැවැත්ම

### ශාස්ත්‍රීය ලිපි සකස් විය යුතු ආකෘතිය

සංක්ෂේපය : වචන 250 - 300 අතර විය යුතු ය
මුඛ්‍ය පද : අවම මුඛ්‍ය පද 3කට හා උපරිම 5කට සීමා විය යුතු ය

1. හැඳින්වීම
2. පර්යේෂණ ක්‍රමවේදය
3. සාකච්ඡාව
4. සමාලෝචනය
5. විමර්ශිත ග්‍රන්ථ

### මාර්ගෝපදේශ

1. වචන 3500 - 5000 අතර විය යුතු ය.
2. සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් ලිපි සම්පාදනය කළ හැකි ය.
3. සිංහල ලිපි සඳහා FM Abhaya ඉංග්‍රීසි ලිපි සඳහා Times New Roman , දෙමළ ලිපි සඳහා Bamini අක්ෂර රූපාකාර භාවිත කළ යුතු ය.
4. අකුරු ප්‍රමාණය - සිංහල හා දෙමළ පොයින්ට් 12
   - ඉංග්‍රීසි පොයින්ට් 11
5. පේළි අතර 1.5 පරතරය යෙදිය යුතු ය.
6. පිටුවේ පහත කෙළවරේ පිටු අංක යෙදිය යුතු ය.
7. මූලාශ්‍රය සටහන් හා විමර්ශිත ග්‍රන්ථ නාමාවලිය APA ක්‍රමයට දැක්විය යුතු ය.

වැඩි දුර තොරතුරු සඳහා: දුරකථන අංක 0778886676, 0112 777328
ආසිරි හපුගොඩ (මාධ්‍ය නිලධාරී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව)
ලිපි 2022. 04. 24 වන දිනට පෙර පහත ඊමේල් ලිපිනය වෙත එවීමට කාරුණික වන්න.
journal.slparliament@gmail.com

අධ්‍යක්ෂ - සන්නිවේදන,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.


පාර්ලිමේන්තු

# ඡායා ගැලරිය

## "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහය දෙවැනි වෙළුම එළි දැක්වීමේ විශේෂ අවස්ථා...
















# පාර්ලිමේන්තු විත්ති


**පුවත් හසුන I 20 වැනි කාණ්ඩය I පෙබරවාරි 2022**

**ISSN 2806 – 5425**



**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka